සැ. යු.- 2012.08.17 දින පළ වූ අංක 1,772 දරන *ගැසට් පත්‍රයේ* I : III සහ II කොටස් පළ නොවීය.

මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2008 වර්ෂයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,773 - 2012 අගෝස්තු 24 වැනි සිකුරාදා - 2012.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්දල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 746 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 සැප්තැම්බර් මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 අගෝස්තු මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2012 ජුනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# විවිධ දැන්වීම්

## ශ්‍රී ලාංකීය උරුමයන් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ජානක ප්‍රියන්ත බණ්ඩාර වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48(1) යටතේ "ශ්‍රී ලාංකීය උරුමයන් පදනම" සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී ශ්‍රී ලාංකීය උරුමයන් පදනම සංස්ථාගත කිරීමයි.

1. ලංකාවේ ජාතික උරුමයන් පිළිබඳ දැනුම රට තුළත් ගෝලීය මට්ටමෙනුත් පතුරුවා හරිමින් ඊට නිසි ජාත්‍යන්තර තත්වය ලබාදීම හා දැනට ඊට බාධා වී ඇති සීමා මායිම් ඉවත් කිරීම මෙන්ම එම උරුමයන්හි වටිනාකම මෙරට ආර්ථික සංවර්ධනය සඳහා සුදුසු අයුරින් ඊට සීමිත වන පරිදි යොදා ගැනීම ;

2. පර්යේෂණ හා ගවේෂණ මඟින් ලංකාවේ ජාතික උරුමයෙහි වටිනාකම් හැඳිනගෙන ඒවා තවදුරටත් සංවර්ධනය කිරීම හා ආරක්ෂා කර ගැනීම ;

3. බාල පරම්පරාවට ජාතික උරුමය පිළිබඳ හැඟීම තහවුරුවීම සඳහා පාසැල් ශිෂ්‍යයන් අතර එම දැනුම වර්ධනය කිරීම ;

යනාදිය වේ.

නීතිඥ, ජානක බණ්ඩාර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

08-570

---

## දහම් පාසල් ගුරු අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ජානක ප්‍රියන්ත බණ්ඩාර වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 48(1) යටතේ දහම් පාසල් ගුරු අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී දහම් පාසල් ගුරු අරමුදල සංස්ථාගත කිරීමයි.

1. දහම් පාසල් ගුරුභවතුන්ගේ දහම් දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කිරීමෙහිලා විධිමත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා ආධාර කිරීම, විධිමත් ගුරු පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම ;

2. දහම් පාසල් ගුරුභවතුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා මාර්ගෝපදේශයන්, ශිෂ්‍යත්ව හා ආධාර ලබාදීම ;

3. දහම් පාසල් ගුරුභවතුන්ගේ ගුරු අවශ්‍යතා හා සුභ සාධනය ඉහළ නැංවීමෙහිලා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

යනාදිය වේ.

නීතිඥ, ජානක බණ්ඩාර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

08-573

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.